# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2368/17 – 2024 ජනවාරි මස 23 වැනි අඟහරුවාදා – 2024.01.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 104/44 (vi) ඒ

**(87 වන අධිකාරය වූ) භාර ආඥාපනත**

114 වන වගන්තිය යටතේ වූ නියමය

"කාන්තා අධ්‍යාපනික හා පර්යේෂණ මධ්‍යස්ථාන" භාරයෙහි භාරකරුවන්, එනම් :-

1. ආචාර්ය නවමණී සෙල්වි තිරුචන්ද්‍රන් ;
2. ආචාර්ය විශාඛා කුමාරි ජයවර්ධන ;
3. මහාචාර්ය මෛත්‍රී වික්‍රමසිංහ ;
4. චූලනී කොඩිකාර

විසින්, (87 වන අධිකාරය වූ) භාර ආඥපනතේ 114 වන වගන්තිය යටතේ සංස්ථාගත කරනු ලැබීම සඳහා අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා, වෙත ඉල්ලුම් කර ඇති හෙයින් ද;

ඉහත කී ආඥාපනතේ 114 වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍ය ආචාර්ය විජයදාස රාජපක්ෂ වන මම, මේ නියමය මගින්, එකී භාරකරුවන් සංස්ථාගත කිරීමට මේ නියමයෙන් බලය පවරන අතර -

(අ) කොළඹ, ප්‍රසිද්ධ නොතාරිස්, "තුලසිකා නීලකන්ඩන්" විසින් සහතික කරන ලද, 2015 මැයි මස 7 වන දිනැති අංක 04 දරන භාර ඔප්පුව යටතේ යථා පරිදි පත්කරන ලද ඉහත නම් සඳහන් භාරයේ භාරකරුවන් සහ ඔවුන්ගේ තත්කාලීන අනුප්‍රාප්තිකයන් "කාන්තා අධ්‍යාපනික හා පර්යේෂණ මධ්‍යස්ථාන භාරය" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් ඇති සංස්ථාපිත මණ්ඩලයක් විය යුතු යැයි ද;

(ආ) එකී භාරකරුවන් විසින්, එකී නාමය සහ අභිධානය යටතේ, එකී භාරය වෙනුවෙන්, යම් චංචල හෝ නිශ්චල දේපළ මිල දී ගැනීම, භාරගැනීම, දැරීම, බදු දීම හෝ අන්‍යාකාරයකින් අත්කර ගැනීම, විකිණීම, හුවමාරු කිරීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, බදු දීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම කළ හැකි යැයි ද; සහ

(ඇ) එකී භාරයට අදාළව පැන නගින සියලු නඩු කටයුතුවල දී, ශ්‍රී ලංකාව තුළ හෝ වෙනත් ස්ථානයක ඕනෑම අධිකරණයක දී එකී නාමයෙන් සහ අභිධානයෙන් එකී භාරකරුවන් විසින් නඩු පැවරීමට සහ නඩු පවරනු ලැබීමට, උත්තර දීමට සහ උත්තර දෙනු ලැබීමට, විත්තිවාචක ඉදිරිපත් කිරීමට සහ විත්තිවාචක ඉදිරිපත් කරනු ලැබීමට ද නීතිය අනුව හැකියාව සහ බලය ඇත්තේ යැයි ද,

විධාන කොට ප්‍රකාශ කරමි.

මේ නියමය ප්‍රත්‍යාදිෂ්ට කිරීම හෝ අවශ්‍ය යැයි මට පෙනී යන ආකාරයට කලින් කල වෙනස් කිරීම හෝ සංශෝධනය කිරීම මා විසින් කරනු ලැබිය හැකි ය.

ආචාර්ය **විජයදාස රාජපක්ෂ,**
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම
ව්‍යවස්ථා අමාත්‍ය.

2024 ජනවාරි මස 18 වැනි දින,
කොළඹ දී ය.

EOG 01-0205

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.